# 'අමරපුර' පිළිගැන්වෙයි






ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ ත්‍රෛමාසික නිල පුවත් සඟරාව 'අමරපුර' නමින් පසුගියදා ගල්කිස්ස ශ්‍රී ධර්මපාලාරාම විහාරස්ථානයේදී එළිදක්වන ලදී.

එහිදී 'අමරපුර' පුවත් සඟරාවේ මංගල කලාපය ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක අතිපූජ්‍ය දවුල්දෙණ ශ්‍රී ඤාණිස්සර හිමිපාණන් වෙත ශ්‍රී ලංකා අමරපුර මහා නිකායාභිවෘද්ධි දායක සභාවේ සභාපති, කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතා විසින් පිළිගැන්වූ අවස්ථාව ඡායාරූපයේ දක්වෙයි. අමරපුර මහා නිකායේ මහා ලේඛකාධිකාරී කොටුගොඩ ධම්මාවාස අනුනායක හිමිපාණන් ප්‍රධාන මහා සංඝරත්නය සහ නිකායාභිවෘද්ධි දායක සභාවේ නිලධාරීහු ද මෙම අවස්ථාවට සහභාගී වූහ.